සියලු හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

47	S	I II

Grade 10 - Pre-Evaluation – August 2022
අනාවරණ පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2022 අගෝස්තු

කාලය : පැය 3
Time: 3 hours

Appreciation of Sinhala Literary Texts
සිංහල සාහිත්‍ය රසාස්වාදය
අනාවරණ පරීක්ෂණය - I

Name: - ..... class: -..... Index no: - .....

- උපදෙස්
  I සහ II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේදී වෙන වෙනම භාරදිය යුතුය.
  I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේම ලිවිය යුතුය.
  II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්කර ලියන පොත භාවිතා කරන්න.
  I පත්‍රය සඳහා ලකුණු 40ක් ද II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

(I) (i) මිහිස් හට මොදරු ගුණ සහ තුඹුණු ඇත
නිදොස් කෙනකු මෙදියත උපදිනේ නැත
වෙසක් සිහිදු පුවරද බර සහස් පත
මකාරොස් තුළින් යුතුවෙයි කවු පෙළිනි යුත

(අ) පළමු ජේළි දෙකේ අර්ථය ලියන්න.

.....
.....

(ආ) මෙම කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

.....

(ii) එබස් අසා රජ්ජුරුවෝ එක්කෙනෙකුන්ට ප්‍රභාවතී පාවා දිනුමේ නම් නොස්සෝ යුද්ධ කරන්නෙහ.

(අ) නෙස්සෝ යනුවෙන් සඳහන් වන්නේ කවු ද?

.....

(ආ) ප්‍රභාවතිය පාවා දීමට හේතුව කුමක් ද?

.....
.....

(iii) (අ) සිංහල නවකතාව කලාත්මක මගකට පිවිසුණේ 1944 දී නිකුත් වූ මාර්ටින් වික්‍රමසිංහගේ කුමන නවකතාවකින් ද ? .....

(ආ) තුන්වැදෑමු නවකතා මොනවාද?

.....

PAST PAPERS WIKI

(iv) (අ) ජාතක කතා යනු මොනවා ද?

.....

.....

(ආ) පන්සිය පනස් ජාතක පොතේ ජාතක කතා කියක් අන්තර්ගතවේ ද?

.....

.....

(v) අනේ මුන්ගේ ඉස උකුණෝ බොහෝව ගියෝ යයි කියමින් තමාගේ ඉසින් උකුණන් හැරගෙන .....

(අ) මෙසේ කළේ කවුද? .....

(ආ) ඉන්පසු සිදුවූයේ කුමක්ද? .....

(02) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු
ඉණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරුවෙයි ලොව ගන අඳුරු
නෙකතරු රැසින් ඒලෙසට නොම වේය දුරු

රුදුරු ගිනිකඳක් ගත් සඳෙහි වනතුරු
මිතුරු වේය දිගනින් හමන මඳ මරු
මිතුරු නැසීමට එම වෙයි පස මිතුරු
මිතුරු නැ කෙනෙක් නිවතුන් හට කවුරු

කුරිරු ගොර සපුන්ගේ දළ ගෙයි විසය
මදුරු මැසි කැලන්ගේ තුඩගෙහි විසය
රුදුරු නුහුසුවන්ගේ වලගෙහි විසය
නපුරු දුදනන්ගේ සියල්හෙහි ම විසය

(i) යහපත් මිනිසුන්ගේ ගති ලක්ෂණ කෙබඳු ආකාරයට පවතීද? (ලකුණු 4)

(ii) මෙහි ඇති උපමාවක් උපුටා දක්වන්න. (ලකුණු 4)

(iii) සත්ත්වයින් හා මිනිසුන්ගේ නරක ගති විග්‍රහා කිරීමේදී එය පවතින ආකාරය තේ කවියෙන් දක්වා ඇත. එය කෙබඳුද? (ලකුණු 6)

(iv) සමාජයට පණිවුඩය දීමට සුභාෂිත කතුවරයා උත්සාහ දරා ඇත. ඒ පිළිබඳව ඔබේ අ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

නැතහොත්

ඉක්බිති ඒ බිසවුද දස ඒකඩමසක් ඇවැමෙන් පුතණු කෙනෙකුන් වැදූහ. ඒ කුමාරයාහට කුස කුමාරයෝ යයි නම් තුබූ හ. ඒ කුස කුමාරයන් පියවර නගා ඇවිදිනා කාලයෙහි අනික් දිව්‍ය පුත්‍රයෙක් දෙව් ලොවින් අවුත් බිසවුන් කුස උපන්හ. ඔහට ජයම්පති යයි නම් තුබූ හ. ඒ රාජකුමාරවරු දෙදෙන මහත් වූ පෙරහරින් පෙරඩමස සඳ සේම වැඩිවිය පැමිණියා හ. මහා බෝධිසත්ත්වයෝ තමන් නුවණැති හෙයින් සියලු ශිල්පයන් ම ආචාරි කෙනෙකුන්ගෙන් නොඉගෙන සිය නුවණින්ම දැන නිම වූහ. ඉක්බිති මහා බෝධිසත්ත්වයන් සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි පිය රජ්ජුරුවෝ කුමාරයන් රාජ්‍යයෙහි අභිෂේක කරනු කැමතිව බිසවුන් කැඳවා "දේවිනි තොපගේ පුතණුවන් අභිෂේක කරවා නාටක ස්ත්‍රීන් හා ඓශ්වර්ය පාවා දී ජීවත් වන්නා වූ අපි රාජ්ජයෙහි පිහිටියාහුගේ ශ්‍රී විභූතිය දැකුම් හ. මේ මුළු දඹදිව යම් රජක්හුගේ දුවක කැමති වේද උන් ගෙන්වා අගමෙහෙසුන් කරම්හ. කවර රජ්ජුරුකෙනෙකුන්ගේ කුමාරිකාවක කැමැත්තෝද උන්ගේ අභිප්‍රාය දැන කියව"යි කිහ. බිසවුන් යහපතැයි ගිවිස කුමාරයන්ට මෙපවත් කියා අභිප්‍රාය විචාරා ගෙන එවයි කියා නම්මිත්තක යවූ හ. ඒ ස්ත්‍රී ගොසින් බෝධිසත්ත්වයන්ට එපවත් කිවුය. ඒ අසා මහා බෝසතාණෝ " මම රූ නැත්තෙමි. රූපශ්‍රීන් යුත්ත වූ රාජ කුමරිකාවක් ගෙනෙන ලද නම් මා දැක යකකු මෙන් විරූප වූ මොහු ගෙන් මට කම් කිම් දැයි පලා යන්නිය.

(1) කුස කුමාරයා ඇවිදින කාලයේ සිදු වූ සිදුවීමක් ලියන්න. (ලකුණු 04)

(2) කුස කුමාරයා තමා ගැන අවබෝධයෙන් සිටි අයෙකුබව පෙන්වන වාක්‍ය කොටස ඡේදයෙන් තෝරා ලියන්න. (ලකුණු 04)

(3) මෙම ඡේදයේ ඇතුළත් උපමාවක් ලියන්න. (ලකුණු 06)

(4) කුස කුමාරයා ඉතා දක්ෂයෙකු බව පෙන්වන අදහස ඔබේ වචනයෙන් ලියන්න. (ලකුණු 06)